# <u>නිවේදනය</u> A

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව **"අධිකරණ සංවිධාන (සංශෝධන)"** නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැන්වීමට කැමැත්තෙමි.

එකී පනත් කෙටුම්පතෙහි 12අ(1) වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග(3)(අ) යන ව්‍යවස්ථාවට අනනුකූල වන බවද, පනත් කෙටුම්පතෙහි 12අ(1) වගන්තිය බලාත්මක කිරීමට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් සිදුකල යුතු බව ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත. මේ සඳහා මෙම පනත් කෙටුම්පත තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් අනුමත කල යුතු වේ. කෙසේ වුවද, 1996 අංක 10 සහ 2006 අංක 54 යන පනත් වල පරිදි 154ග(3)(ඇ) ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලය පළාත් මහාධිකරණය වෙත පැවරී ඇත්තේ නම් මෙම සංශෝධිත වගන්තියෙන් ඇති වන අනනුකූලතාවය ඉවත්ව යනු ඇත.

12අ(2) වගන්තිය සංශෝධනය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය සඳහා විනිශ්චයකාරවරුන් නම් කිරීම අවශ්‍ය වේ. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග(2) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර, 12අ(2) වගන්තිය බලාත්මක කිරීමට නම් තුනෙන් දෙකක බහුතර ඡන්දයක් අවශ්‍ය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකල යුතු වේ. කෙසේ වුවත්, මෙකී පනත් කෙටුම්පතේ 12අ(2) ඉවත් කොට 154ග(2) ව්‍යවස්ථාව පවත්නා පරිදි තැබීමෙන් මෙම අනනුකූලතාවය පහව යනු ඇත.

12(අ)(7) වගන්තිය සංශෝධනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවට අනනුකූල වේ. කෙසේ වුවත්, අග්‍ර විනිශ්චයකාරවරයාට විශේෂ අධිකරණ විභාගයක් පැවැත් විය යුතු ද නැති ද යන්න තීරණය කිරීමට බලය ලබා දීම මඟින් මෙකී වගන්තිය සංශෝධනය වීමෙන් ඇති වන අනනුකූලතාවය ඉවත්ව යනු ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි යෝජනා කරමි.